# අනුරාධපුර හා පොළොන්නරු යුගයේ මෙරට ක්‍රියාත්මක වූ අභයදාන සංකල්පය හා එහි ස්වභාවය (සාහිත්‍ය හා පුරාවිද්‍යා මූලාශ්‍රය ඇසුරින්)

සහය කථිකාචාර්ය එම්. ඒ. ප්‍රසාද් කුමාර

## හැඳින්වීම

දානයන් අතර උත්තරීතර දානයක් ලෙසින් බුද්ධ දේශිතය තුළ පවා පිළිගැනෙන අභයදාන සංකල්පය අනුරාධපුර, පොළොන්නරු යුගවලදී විවිධ ස්වරූපයන් සහිතව ක්‍රියාත්මක වෙමින් වර්තමානය දක්වා පැමිණ තිබේ. සත්ත්වයන්ට භය හේතුවක් එළඹ සිටි කල්හි රැකවරණය සළසා අස්වසාලීම ''අභයදානය'' නම් වේ. දානය නම් දීමයි. අභයදානය නම් නිර්භයත්වය ප්‍රධානය කිරීමයි. විපතට පත්වූ පුද්ගලයකුට හෝ සත්ත්වයෙකුට නිර්භයත්වය ප්‍රධානය කරනු ලබයි නම් එය ''අභයදානය'' ලෙස සරලව හඳුනාගත හැකිය. දානය යන්නෙහි එක් ප්‍රභේදයක් වන අභයදානය විවිධ මූලාශ්‍රයවල විවිධ අයුරින් අර්ථ විග්‍රහ කර ඇත. අටුවා වල අභයදානය පිළිබඳ මෙසේ දක්වා තිබේ. ''අභයදානං පන රාජතෝ චෝරතො අග්ගිතෝ උදකතෝ වෙරිපුග්ගලතො සිහබ්‍යග්ඝයක්ඛරක් ඛසාදිතෝ සත්තානං භයෙ පච්චුපට්ඨිතෙ තතෝ පරිත්තාණභාවෙන වේදිතබ්බං'' යනුවෙනි.

---

'උපාසනා', මකුරුප්පේ පඤ්ඤාසේකර නාහිමි ශාස්ත්‍රීය සංග්‍රහය, සංස්. මහාචාර්ය මකුරුප්පේ ධම්මානන්ද හිමි, රාජකීය පණ්ඩිත ඇහැලේපොල මහින්ද හිමි, 2017.

ජීවිතයක් මුදවා ගැනීම, රජ, සොර, සතුරු ගිනි, දිය යන පංච උපද්‍රව වලින් ආරක්ෂා කිරීම, අභයදානය වන බව එහි අර්ථයයි. තවද වධයට නියම වූ මිනිසුන් හෝ සිව්පා ආදි සත්ත්වයන් මරණයෙන් මුදවා දිවි රැකීම ද අභයදානයකි. අසවල් සතුන් නොමැරිය යුතුය, මේ ස්ථානයෙහි සතුන් නොමැරිය යුතුය, ආදි වශයෙන් මාඝාතය පැනවීම හෙවත් සතුන් නොමරන සේ නිති පැනවීම ද යටත් පිරිසෙයින් මැදිරි ආදියෙන් බඳනා ලද සත්ත්වයන් නිදහස් කොට හැරීම ද අභයදානයෙන්ම සංග්‍රහ වේ. අංගුත්තර නිකායේ පංචක නිපාතයෙහි ප්‍රාණඝාතාදි පංච දුෂ්චරිතයෙන් වැළකී සිටීම ද අභයදානයකැයි දක්වා ඇත. එකෙකුගේ දුෂ්චරිත ක්‍රියාව අන්‍යයන් හට පීඩා පිණිස පවත්වා හෙයින් එසේ දක්වන්නට ඇත. මෙසේ විවිධ මූලාශ්‍රයවල විවිධ අයුරින් විග්‍රහවන ''අභයදානය'' පුරාණ ලංකාවේ ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳව සාහිත්‍යය හා අභිලේඛන මූලාශ්‍රය ඇසුරින් පුළුල්ව සාකච්ඡා කිරීම මෙම අධ්‍යයනයෙන් සිදු කෙරේ.

මෙම අධ්‍යයනය සිදු කිරීමේ දී අනුරාධපුර යුගය ආරම්භයේ සිට පොළොන්නරු යුගය අවසානය දක්වා වූ කාල සීමාව පර්යේෂණය සීමාව වශයෙන් ගෙන අධ්‍යයනය සිදු කර ඇත. අභයදානය සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් සාහිත්‍යයමය හා අභිලේඛණ මූලාශ්‍රය හඳුනාගැනීම, ඒවා සියුම්ව අධ්‍යයනය කිරීම, එකී මූලාශ්‍රයවලින් හෙළිවන අභයදානය සංකල්පය ලංකාව තුළ ක්‍රියාත්මක වූයේ දේශීය ආභාසයක් සහිතව ද, විදේශීය ආභාසයක් සහිතව ද යනුවෙන් එහි ප්‍රභවය හඳුනා ගැනීම,මෙන්ම මෙරට ක්‍රියාත්මක අභයදානයන්ගේ ස්වරූපය හා එවායේ සමාජ වැදගත්කම හඳුනා ගැනීම ආදිය මෙම අධ්‍යනයෙහි මූලික අරමුණ වේ.

අනුරාධපුර යුගයේ ආරම්භයේ සිට පොළොන්නරු අවසානය දක්වා ශ්‍රී ලංකාවේ අභයදානය ක්‍රියාත්මක වීම පිළිබඳ සොයා බැලීමේ දි පාදක කර ගැනීම සඳහා මූලාශ්‍ර කිහිපයක් ඇසුරු කිරීම සිදුවිය. මහාවංශය, චූලවංශය, ඇතුළු වංශකතා,

පන්සිය පනස් ජාතක පොත, වෙනත් අට්ඨකතා ආදි සාහිත්‍ය නිර්මාණ මේ අතරින් ඓතිහාසික මූලාශ්‍රයන් වේ. මීට අමතරව ගිරි ලිපි, ටැම් ලිපි, පුවරු ලිපි, ආදී අභිලේඛණ මූලාශ්‍ර සම්බන්ධව ක්ෂේත්‍ර පරික්ෂණයක් ඔස්සේ තොරතුරු ලබා ගැනීම සිදු විය.

මහාචාර්ය සෙනරත් පරණවිතාන, මහාචාර්ය දැරණියගල ආදි විද්වතුන්ගේ පර්යේෂණ හා නිරීක්ෂණ වාර්තා ද බෙල්ලන ඥානවිමල හිමියන්ගේ අශෝක ශිලා ලේඛණ, අබය ආරිය සිංහයන්ගේ අශෝක ධම්ම ලිපි, කොත්මලේ අමරවංශ හිමියන්ගේ ලක්දිව සෙල්ලිපි, ඒ ලගමුව විසින් රචිත මධ්‍යකාලින රාජධානිය පොළොන්නරුව, ලංකා විශ්ව විද්‍යාලය,ලංකා ඉතිහාසය I II කාණ්ඩ ආදි කෘතින් ද දෙවන මූලාශ්‍රය වශයෙන් පරිශීලනය කර මෙම අධ්‍යයනය සිදු කර ඇත.

## විමර්ශනය

"අභයදානය" යන සංකල්පය මුල්වරට සමාජයට හඳුන්වාදුන් උත්තරිතර දේශකයාණෝ බුදුරජාණන් වහන්සේ ය. බුද්ධ දේශිතය තුළ උතුම් දානයක් ලෙස අභයදානය දක්වා තිබේ. මරණ භයින් තැතිගෙන වේදනාවෙන් සිටින සත්ත්වයින්ට පිහිටක් වන්නට යමෙකුට හැකිනම් එය මේ භවයටත්, පරලොවටත් මහත්ඵල මහානිසංස ගෙන දිමට කාරණයක් වන බව බෞද්ධ දර්ශනයේ සඳහනි.

" අභයදානය දත්වාන
ජන්තුනො භයතජ්ජිතො
දයානිසංසේ අනුහෝමී
කම්මානුච්ජකෙ"[1]

මරණයට කැපවූ භයින් තැතිගත් අසරණ සතුන් කරුණාවෙන් යුතුව මරණයෙන් මුදවාගන්නා පුද්ගලයාට සසර වසනාතුරු ලැබෙන කුසල විපාක දහයක් වන බව එම ගාථාවෙන් දැක්වේ. උපනුපන් ආත්ම භාවයන් වලදි කිසිදු මාරක

බන්ධනයකට අසුනොවීම,නීරෝගී සම්පත්තිය ලැබීම, දීර්ඝායු සම්පත්තිය ලැබීම. රාජ රාජ මහාමාත්‍ය සහ සිටු පවුල්වල බොහෝ සම්පත් ඇතිව උපත ලැබීම, දිව්‍යලෝක, බ්‍රහ්මලෝක, ආදියෙහි සම්පත් ලැබීම, සෑම තැනකදීම උසස් පුද්ගලයකු ලෙස කැපී පෙනෙන සේ ආරෝහණ පරිණාහ සම්පත්තියෙන් යුක්ත වීම, උගත් නුගත්, දුප්පත්, පෙහොසත්, බලවත්, දුබලවත් කවර කෙනෙකුන් වුව ද අවනත කර ගැනීමේ ශක්තියක් ලැබීම, පංච අභිඥා අෂ්ඨ සමාපත්තිලාභිව මහරහතන් බවට පත්වීමේ භාග්‍ය ලැබීම එම කුසල විපාක දහයයි. ඒ අනුව දානය උතුම් ක්‍රියාවක් වශයෙන් සමාජගත කිරීමට බුදුන් වහන්සේ තම දේශිතය තුළින් උත්සාහ ගෙන ඇත.

රජුගේ ජන්ම උත්සව දිනයේ දීත්, ඔටුන්න හිමි කුමාරයා උපන් දිනයේදීත්, රාජාභිෂේක දිනයේදීත්, අලුතෙන් රටක් ආක්‍රමණය කොට ජයගත් අවස්ථාවේදීත්,රටේ සිරකරුවන් අභයදානය කළ යුතු බව කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍රයෙහි සඳහන් වේ.[2] ඒ අනුව රාජ්‍යත්වය හා බැඳි සුවිශේෂී සෑම අවස්ථාවකදී ම සත්ත්වයන් හට අභයදීමක් පිළිබඳ පැහැදිලිව අර්ථ ශාස්ත්‍රය මඟින් තහවුරු කොට ඇත. ඉන්දියාවේ ප්‍රථම බෞද්ධඅධිරාජ්‍යයා වූ ධර්මාශෝක අධිරාජ්‍යයාගේ ශිලා ලිපි ගණනාවකම ඔහු සත්ත්වයන්ට අභය දානය දුන් බව සඳහන් කර ඇත. අශෝක රජතුමාගේ සවිසිවන රාජාභිෂේක වර්ෂයේදී කරවන ලද පස්වන දිල්ලිතොප්රා ටැම් ලිපියෙහි රජු විසින් විසිපස් වතාවක් සිරකරුවන්ට අභය දානය දුන් බව දක්වා තිබේ.

''යාව සඩු විසතී වස අභිසිතේන මෙ එතායේ අංගුලිකායෙ පංනවීසති බන්ධන මොඛානි කටානි...''[3]

ඒ අනුව අවිහිංසාවාදය තුළින් ජීවිත ආරක්ෂාව සුරක්ෂිත කිරීමට ඔහු ගෙන ඇති උත්සාහය හඳුනාගත හැකිය ධර්මාශෝක රජු මිනිසුන්ට පමණක් නොව තිරිසන් සතුන්ට ද අභය දුන් බව ශිලා ලිපි ගණාවකම සඳහන්ව ඇත.

**පළමු ගිරි ලිපිය** :- ''දේවානම්පිය පියදසිගේ මහා මුළු තැන්ගෙ යි සුප පිළියෙල කිරීම සඳහා පෙරදහස් ගණන් බොහෝ ජීවීහු දිනපතා මරණු ලැබෙති. එහෙත් දැන් මේ ධම්ම ලිපි ලියවන්නේ යම් කලෙක ද එකල්හි මොණරුන් දෙදෙනෙකු සහ මුවන් එකකු දැයි ජිවීන් තිදෙනෙක් පමණක් මරණු ලැබේ. මේ තුන් ජිවිත පවා මතු මරණු නොලබත්..''[4]

**දෙවන ටැම් ලිපිය** :-''දෙපා සිව්පා සතුන් විෂයෙහි ද පක්ෂීන්, මත්ස්‍යයින් විෂයෙහි ද ජීවිත දානය දක්වා විවිධ අනුග්‍රහයන් ම විසින් කරන ලදි.''[5]

**දිල්ලිතොප්රා ලිපිය**:-''රජ මෙසේ කියයි. අභිෂේකකළ සවිසිවස් ඇත්තාවු මා විසින් මේ ජිවීහු නොනැසිය යුතු කරන ලදහ. එනම් ගිරව් සැළලිහිණි යන මොවුහුද සිව්පාවෝ ද යන මොවුහු ද වෙති. එළු දෙනැහුරු දෙන ද ගැබිණි වුවා හෝ කිරි පොවන්නී නොමැරිය යුතුය... නියමිත හැම උපෝසක දිනයන්හි ද මසුන් නොමැරිය යුතුය. නොවිකිණිය යුතුය"[6]

බෞද්ධ පාලකයා මිනිසුන්ට පමණක් නොව සිව්පාවුන්ට ද, පක්ෂීන්ට ද, මත්ස්‍යයන්ට ද, අභය දිය යුතුබව ධර්මාශෝකයන්ගේ දර්ශනය වි තිබේ. ඒ අනුව මාඝාතය පැනවූ ප්‍රථම බෞද්ධ පාලකයා වශයෙන් ධර්මාශෝක රජු මූර්තිමත් කොට දැක්වීම කළ හැකිය.

මෙසේ මෞර්යය ධර්මාශෝක රජ දවස භාරතීය සමාජ පසුබිම තුළ අභයදානය වැදගත් සංකල්පයක් බවට පත් වු අතර මහින්දාගමනයත් සමඟින් එය ශ්‍රී ලංකිකය සමාජයට දායාද විම සිදු වී තිබේ. මෞර්යයන් ධර්මාශෝක හා දෙවනපෑතිස් රජු අතර ඇති වූ නොදුටු මිත්‍ර සම්බන්ධතාවයේ ප්‍රතිඵලයක් වශයෙන් බුදුදහම ලංකාවට ලැබුණු බව පිළිගන්නා කාරණයකි. මහාවංශයේ සදහන් කරන ආකාරයට මිහිඳු මාහිමියන්ගේ

ලංකාගමනය සිදුවන විටත් මෙරට පාලකයා වූ දෙවනපෑතිස් රජු සතළිස් දහසක් සිවරඟ සෙනඟ පිරිවරාගෙන මිස්සක පව්ව අසළ මුවදඩයමෙහි සැරසරමින් සිට ඇත. ඒ අනුව ප්‍රාග් බෞද්ධ යුගය තුළ සත්ත්ව හිංසනය සමාජය තුළ විනෝද ජනක ක්‍රීඩාවක් බවට පත්ව තිබූ බව පැහැදිලිය. කෙසේ වුවත් මිහිඳු හිමි හා දෙවනපෑතිස් රජු අතර ඇතිවූ දීර්ඝ සංවාදයේ ප්‍රතිඵලයක් වශයෙන් බුදුදහම මෙරටට ලැබුණු අතර චූල්ලහත්ථිපදෝපම, දේවදූත හා බාලපණ්ඩිත වැනි සූත්‍ර දේශනා මගින් ආධ්‍යාත්මය සංවර්ධිත මිනිසුන් කොටසක් නිර්මාණය කිරීමට මිහිඳු හිමි උත්සාහ ගෙන ඇත. තෝරා ගනු ලැබූ දේශනාවන්හි සාරය දෙස බලන විට ඒවා පව්කම්හි දුර්විපාකත්, පින්කම්හි සුඛවිහරණත් පිළිබඳව විස්තරාත්මකව ප්‍රකාශිත ඒවා බව පැහැදිලි වේ. තම පිය රජ වූ ධර්මාශෝක රජතෙම විහාර යාත්‍රාවෙහි යෙදෙමින් පෙර සතුන් මරණයට පත්කළත්, පසුව ධර්ම යාත්‍රා අනුගමනය කරමින් සියලු සත්ත්වයන් හට අභය දිය යුතුය යන්න මිහිඳු හිමිගේ දර්ශනය වන්නට ඇත. ධර්මය අවබෝධ කරගත් දෙවනපෑතිස් රජු ධර්මය කෙරෙහි පැහැදී මහමෙව්නා උයන සඟසතු කොට පූජා කිරිම සිදු කළේය. බරණැස් නුවර ආදි නගරවල පැවති මිගදාය නම් උද්‍යාන, අභයදානය නිසා ගොඩ නැගුනේ යම් සේ ද මහමෙවුනා උයන ද මිහිඳු හිමියන් දර්ශනයෙන් අභය භූමියක් ලෙස ගොඩනැගෙන්නට ඇත. ඒ අනුව ශ්‍රී ලාංකේය ඉතිහාසය තුළ අභය භූමි සංකල්පය ක්‍රියාත්මක වූ ප්‍රථම ඓතිහාසික ස්ථානය මිහින්තලා පුදබිම යයි සිතීම කළ හැකිය.

මිනිසුන්ට හා සතුන්ට අභය දුන් අවස්ථා කිහිපයක් පිළිබඳ අනුරාධපුර යුගයේ ඉතිහාසයේ සඳහන්ව ඇත. රජවරුන්ගේ විරුද්ධව කැරළි ගැසූ තැනැත්තන්ට හෝ මරණීය දණ්ඩනය නියමව සිටින අයට හෝ සමාජයට විරුද්ධව යම් කිසි වරදක් කළ වුනට හෝ මරමුවට පත්විය හැකි අසරණ තිරිසන් සතුන්ට අභයදානය දීම, ඔවුන් මරණයෙන් හෝ ශාරීරික පීඩාවෙන් හෝ වස්තු විනාශයෙන් මුදවා ගැනීම රජුගේ බලවත්කම් අතර ප්‍රධාන කාරණයක් වී තිබේ. අනුරාධපුර රාජධානිය නගරයක් ලෙස

නිර්මාණය කරගත් ප්‍රථම පාලකයා වූ පණ්ඩුකාභය රජු තමාගේ මයිලන් අටදෙනා මරා දැමූ නමුත් වැඩිමහල් මයිලනුවන් වූ අභය රජුට ද, ගිරිකණ්ඩ ශිව නම් මයිලනුට ද ජීවිත දානය දුන් බව මහාවංශයේ සඳහන් වේ.

"මයිල්හු එපවත් අසා රජහු හැර ඔහු හා යුධ පිණිස එළඹියේය. රජුගේ බෑයෝ නව දෙනා ඒ අසා රජහට කිපියෝ "තෙපිට බොහෝ කලක් උපකාර වෙහිය දැන් රට දෙති. එහෙයින් තොප මරන්නෙමුය" කීවුය. ඒ රජ උන්ට රජය පාවා දුන්නේය. ඒ සියල්ලෝම එකඟව තිස්ස නම් බෑයා රජයට ප්‍රධාන කළෝය. අභයදායක තෙමේ අභය රජ තෙමේ පස් අවුරුද්දක් ඒ උපතිස්ස ගම්හි වෙසෙමින් රජය කළෝය..." [7]

මීට අමතරව දුටුගැමුණු රජු (ක්‍රි.පූ 161 -137) හා එතුමාගේ සොහොයුරු තිස්ස කුමාරයා අතර ඇතිවූ යුද්ධයෙන් පසු සංඝයාගේ ඉල්ලීම නිසා එතුමා තම සෙහොයුරා දඬුවම් නොකොට නිදහස් කිරීම ද අභය දීමක් ලෙස කල්පනා කළ හැකිය.

මිනිසුන්ට පමණක් නොව තිරස්චීන යැයි සම්මත සතුන්ට පවා අභය දුන් අවස්ථා පිළිබඳ අනුරාධපුර ඉතිහාසය තුළින් තොරතුරු ලැබේ. මහානාගගේ පුත් ආමණ්ඩගාමිණී අභය රජු (ක්‍රිːව 19-29) ලක්දිව මුළුල්ලේම සතුන් මැරීම නීතියෙන් තහනම් කොට ප්‍රාණීන්ට අභය දුන් බව මහාවංශයේ සඳහනී.

"මාඝාතං සකලෙ දීපෙ, කාරෙසි මනුජාධිපො
වල්ලිඵලානි සබ්බාහි, රොපායිත්වා තහිං තහිං"[8]

සිලාකාල රජු විසින් ද (ක්‍රිːව 518-531) මෙවැනි නීති පනවා සතුන්ට අභයදානය දුන් බව මහාවංශයේ පැහැදිලිව සඳහන් කර ඇත.

"මාඝාතං කාරයි දීපෙ, සබ්බේ සුංයෙව පාණිනං
ආනීතං අත්තනා කේස, ධාතුං සම්මා අපූජයී..."[9]

ක්‍රි:ව. 718-724 අතර ලක්දිව පාලනය කළ තුන්වන කාශ්‍යප රජු තිරස්චීන යැයි සම්මත සියලු ප්‍රාණීන්ට අභය දුන් බවක් මහාවංශයේ දැක්වේ. මේ සියලු කාරණා වලට අනුව පාලකයන් මිනිසුන් මෙන්ම සතුන්ට පවා අභය දානය දෙමින් සුඛිත මුදිත පාලනයක් ගෙන යාමට දරා ඇති උත්සාහය පැහැදිලිය. මිනිසුන්ගේ හා සතුන්ගේ ජීවත්වීමේ අයිතිය නැති කරන්නවුන්ට එරෙහිව මරණ දණ්ඩනය පවා නියම කිරීමට අනුරාධපුර යුගයේ ඇතැම් රජවරු පෙළඹී තිබේ. IV වන මිහිඳු රජුට අයත් වේවැල්කැටිය ශිලා ලිපියේ මිනිමැරුම් වෙනුවෙන්, මීගව, එළගව,එළුවන් සොරකම් කොට මැරීම වෙනුවෙන් මරණීය දණ්ඩනය ලබා දිය යුතු බව දක්වා ඇත.

"මැරුවෙහු මරා පට්වනු කොට් ඉසා,ගෙරිගොන්, එළුවන්, මැරුවන් මරා පට්වනු කොට්ඉසා..."[10] යනුවෙනි. රටේ සියලු සත්ත්වයන් වෙත සුරක්ෂිතව ජීවත්වීමේ නිර්භයත්වය සුළු පිරිසකගේ නොමනා ක්‍රියාවන් නිසා අනාරක්ෂිත වීම වැළැක්වීම සඳහා මෙවැනි පියවරක් අනුගමනය කරන්නට ඇත.

අනුරාධපුර යුගයෙන් පසු ලංකාවේ දෙවන රාජධානිය ලෙස වැදගත් වූ පොළොන්නරු සමය තුළදී ද විවිධ පාලකයන් ලබා දුන් අභයදානය පිළිබඳ සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මගින් තොරතුරු ලැබේ. චූලවංශය ඇතුළු වංශකතා මෙන්ම අභිලේඛණ මූලාශ්‍රයවල එන විස්තර වලට අනුව යම් යම් පුද්ගලයින් රජු වෙනුවෙන් කරන ලද වටිනා සේවය තකා රජු විසින් ස්වේච්ඡාවෙන් කරන ලද අභයදාන ගැන ද රට වැසියන් තුළ තමා කෙරෙහි යම් යම් දේ ගැන ඇති සැකය දුරු කිරීම පිණිස රජු විසින් සිය කැමැත්තේන් කෙරුණු අභය දානය ගැන ද එමෙන්ම යම් යම් පුද්ලයින්ගේ හා රට වැසියන්ගේ ඉල්ලීම නිසා කෙරුණු අභයදානය ගැන ද තොරතුරු ලැබී ඇත. මහා විජයබාහු රජතුමාගේ පනාකඩුව තඹ සන්නසෙහි සඳහන් පරිදි එතුමා රුණු දණ්ඩනායක සිත්නරුබිම් බුදල්නාවන්ට හා ඔවුන්ගේ පැවත එන්නන්ට අභය දානය වදාළේ බුදල්නාවන් තමා කුඩා

කල සොළීන්ගෙන් රැකගෙන තමාට කළ සේවයට ගරු කිරීමක් වශයෙනි.

"සිත්නරුබිම් බුදල්නාවන් අප සොළි දෙමළුන් විබලයෙන් සිය රජින් පිරිහි ගල්වලැ වැළහි වන අවදියැ... විපකුන් කෙරෙන් වළහා තන්හි තන්හි විග්‍රහ බැන්දැ... සිය රජ්හි පිහිටුවා දුක්වුන් ප්‍රශාදයට මෙකුන් දරු මුණුබුරන් මෙකුන්ගේ අන්වය ආවු සේ දඩ මුඩු ගතැ යුතු දෝෂයක් කළ ද බසින් පටවා කරන දැහැවිල්ලෙන් මුත් දඩුමුඩු නොගන්නා දඟලා නොපටවනු දිවිදි මිස යම් පමණ ද්‍රෝහයක් කුදු කළ අභය දී..."[11]

යට දැක්වෙන සඳහන අනුව මරණීය දණ්ඩනයෙන් මිස නොමිදිය හැකි වරදක් ඇති වුවද තුන්වාරයක් දක්වා ඔහුට සමා කළ යුතු බවත්, රාජාද්‍රෝහි ක්‍රියාවක් කළ ද ඔහුට අභය දානය දිය යුතු බවත් දක්වා තිබේ. මෙහිදි රජතුමා අභය දී ඇත්තේ බුදල්නාවන්, රජුට හෝ සමාජයට විරුද්ධව කරන ලද්දා වූ වරදක් නිසා නොවේ. තමාට කළ උපකාරයට මතු වට ඔවුන්ට විය හැකි උපද්‍රව වළකා අනාගත අභය දිමක් වශයෙනි. එනිසා ම මෙය සුවිශේෂි වැදගත්කමක් හිමිකර ගන්නා අභය දිමක් ලෙස සැළකිය හැකිය.

මහා පරාක්‍රමබාහු රජුගේ උපත පිළිබඳ සඳහන් කරන තැන චුලවංශ කතුවරයා අභය දිමක් පිළිබඳව සදහන් කර ඇත.

"මානාභරණ රජතෙමේ සිය පුතුන් උපන් අස්න අසා අමාවෙන් අබිසෙස් ලද්දෙක් සේ ප්‍රිතියෙන් පිරුණා වූ මනෝරථ ඇත්තේ ඍඑකල සිරගෙයි බැදි බොහෝ ජනයන් මුදවා.... "[12]

මේ අනුව මාණාභරණ රජතෙම තමාට පරාක්‍රමබාහු නම් පුතුන් උපන් සන්තෝෂය ප්‍රකාශ කිරීම උදෙසා සමකාලීන සමයෙහි සිර ගෙයි ලා සිටි බොහෝ ජනයන් ඉන් මුදවා අභය දුන් බව සඳහන්ව ඇත. කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍රයෙහි එන

ඔටුන්න හිමි කුමාරයා උපන් දිනයේ අභය දිය යුතුය යන අදහස මානාභරණ රජු ප්‍රායෝගික කොට ඇති බව පැහැදිලිය.

නිශ්ශංකමල්ල රාජ සමය (ක්‍රි:ව 1187-1196) ලංකා ඉතිහාසයේ අභය දීම සම්බන්ධයෙන් සුවිශේෂී කාල පරිච්ජේදයකි. ඔහු විසින් පිහිටුවන ලද ලංකාවේ දීර්ඝතම ශිලා ලේඛණය වන ගල්පොත ශිලා ලිපිය ඇතුළු ශිලා ලිපි ගණනාවකම රජු විසින් ලබා දුන් අභයදානය පිළිබඳ තොරතුරු සඳහන් කරයි. හෙතෙම වනාන්තර වල වෙසෙන තිරිසන් සතුන්ටත්,වැව් ආදියෙහි ජීවත් වූ මසුන්ටත් අභය දුන් බැව් ශිලා ලිපි කිහිපයකම දක්වා ඇත.

**හැටදාගේ සෙල් ලිපිය** - "මහවෑ තැන ප්‍රාණීන්ට අභයදී"[13]

**රන්කොත් වෙහෙර ආසන ලිපිය** - "කැති අඩ හැම කලටමැ හැර මහවෑ තැන ප්‍රාණීන්ට අභයදී......"[14]

**ගල්පොත ශිලා ලිපිය** - "එරට සුභික්ෂි කොට සත්ත්වයන්ට අභය දාන දී"[15]

නිශ්ශංකමල්ල රජතෙම අය බදු ගැනීම් ආදිය නවත්වා මහජනයාට සහනය දීම, තුලාභාර දන්දීම, දුස්සීල භික්ෂූන් ශාසනයෙන් පලවා හැර රැකියා ලබා දිම, රුවන්වැලි සෑ වැඳීමට ගොස් මසුරන් 4000000 පිදීම ආදී කරුණු කාරණා රැසක් ඇතුළත් කරමින් පිහිටවූ අනුරාධපුර සෙල්ලිපියේ අභයදානය පිළිබඳව සුවිශේෂී තොරතුරක් සඳහන් වී තිබේ.

"රුවන්වැලි මළුවට වැඩැ සතළිස් ලක්ෂයක් මසුරනින් පූජා කොට නුවරට හාත්පසින් සත් ගව්වක් පමණැ තැන හැම සතුන් නොමැරිය හැක්කැයි අභය දී බෙරලවා.. දෙළොස් මහවෑ තැන මසුන්ට අභයදී.... පක්ෂින් නොබඳවා නියායෙන් සම්මත කොට පක්ෂින්ට අභයදී..."[16]

මේ අනුව නිශ්ශංකමල්ල රජු රුවන්වැලි සෑය පිහිටි භූමියෙන් ගව් හතක් පුරාවට සතුන් නොමැරිය යුතු බවත්,

මහවැව් වල මසුන් නොමැරිය යුතු බවත්, පූජා නගරයේ ඉහළ අහසේ සැරිසරන කුරුල්ලන් නොමැරිය යුතු බවත්, දක්වමින් නීති පනවා ඇති අයුරු පෙනේ. මිනිසා මෙන්ම තිරස්චීන යැයි සම්මත සිව්පා, මත්ස්‍ය, පක්ෂි, ආදි ඕනෑම සත්ත්වයකු වෙත අභය ලබා දෙමින් නිශ්ශංකමල්ල රජු කළ කාර්යභාරය කාලීන වැදගත්කමක් හිමිකරගන්නා බව කිව යුතුය.

''සාහිත්‍ය හා අභිලේඛණ මූලාශ්‍රය වලින් හෙළිවන අනුරාධපුර හා පොළොන්නරු යුගයේ අභය දානය'' මැයෙන් කරන ලද අධ්‍යයනයේ දී හඳුනාගත හැකි වූ මූලික කරුණු කිහිපයකි. එනම් දානයන් අතර උත්තරීතර දානයක් ලෙස "අභයදානය'' සමාජයීය වැදගත්කමක් සහිතව ක්‍රියාත්මක කළ ප්‍රථම ආගමික ශාස්තෘවරයාණෝ බුදුන් වහන්සේය. ධර්මාශෝක රජු ද අභයදානය සංකල්පයට සමාජීය වැදගත්කමක් එක් කරන්නට උත්සාහ ගත් අතර ඔහු විසින් තම අභිලේඛණ මගින් මිනිසුන්ට මෙන්ම තිරිසන් සතුන් වෙතද අභය දුන් බවට ප්‍රචාරණය කර ඇත. මහින්දාගමනයේ ප්‍රතිඵලයක් වශයෙන් අභයදානය සංකල්පය ලාංකීය සංස්කෘතියට දායකවූ අතර ලංකා ඉතිහාසයේ අභයදානයය ක්‍රියාත්මකවූ ප්‍රථම අභය භූමිය මිහින්තලා පුදබිමයි. ඉන් අනතුරුව විවිධ පාලකයන් යටතේ අනුරාධපුර, පොළොන්නරුව යුගවලදී අභයදානය සංකල්පය ක්‍රියාත්මක වූ අතර එය විවිධ යුග පසු කරමින් වර්තමානය දක්වා ද පැමිණ තිබේ. අතීත ලංකාවේ අනුරාධපුර, පොළොන්නරු යුගවල දී මෙන්ම වත්මන් යුගයේදීත්, අභයදානය සංකල්පයට කාලීන වැදගත්කමක් හිමිවිය යුතු බැව් සඳහන් කළ යුතුව තිබේ.